# 1.43 ශ්‍රී ලංකාවේ වැලිතර-බලපිටිය ප්‍රදේශයේ ප්‍රචලිත කිරි පොහොය ශාන්තිකර්මය

කේ. කේ. පී නෙලිකා කාරියවසම්
දෘශ්‍ය කලා සැළසුම්කරණ හා ප්‍රාසංගික කලා ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

ශ්‍රී ලංකාවේ වැලිතර- බලපිටිය ප්‍රදේශයන් හි ජීවත්වන ගම්වාසීන් විසින් පත්තිනි දේවිය උදෙසා මුඛ්‍ය වශයෙන් ද, කතරගම සහ දෙවොල් දෙවිවරු උදෙසා ද පවත්වනු ලබන මඩු ශාන්තිකර්ම විශේෂයක් ලෙස කිරි පොහොය ශාන්තිකර්මය හඳුන්වාදිය හැකි ය. මෙය ශුද්ධ පොහොය (සුද්ද පෝය), ඇහැළ පෝය, කිරි පොහොය සහ ජොරා මැරීම යනුවෙන් ජන වහරේ දී හැඳින්වේ.

මෙම ශාන්තිකර්මය පිළිබඳව ප්‍රාදේශීය වශයෙන් පවත්නා මතය වන්නේ එය එම ප්‍රදේශයේ වාසය කළ විවිධ කුල අතරින් සලාගම කුලිකයන්ගෙන් ප්‍රභවය වූ බවයි. ශුද්ධ පොහොය වශයෙන් ගැමියන් විසින් හඳුන්වනු ලබන ඇසළ පුර පසළොස්වක පොහොය හා බැඳුණු චාරිත්‍ර වාරිත්‍ර පද්ධතියක් ඔස්සේ මෙම ශාන්තිකර්මය ගොඩනැගී ඇත. කිරි පොහොය ශාන්තිකර්මයේ මුඛ්‍ය අරමුණ සෞභාග්‍ය ළඟා කර ගැනීම වන අතර ගම්වාසීන්ගේ වස්දොස් දුරු කර ගැනීම හා ශාන්තිය උදා කර ගැනීම ද අපේක්ෂා කෙරේ.

ඇසළ මාසය උදාවත් ම ශාන්තිකර්මය පැවැත්වීමට සුදුසු වාතාවරණයක් ගොඩනගා ගැනීම සඳහා සියලු ම අපවිත්‍ර දැයින් මිදී පවිත්‍ර වීම අවශ්‍ය සාධකයක් සේ සැළකේ. සාමාන්‍යයෙන් කිරි පොහොය පූජා කර්ම පවත්වන්නේ අල්ලිය - ආරච්චිලා කෝවිලේ පූජාව යනුවෙන් හැඳින්වෙන පූජාවකින් පසුව ය. ( මී ගහ කෝවිල, ගණේ කෝවිල, ගහ කෝවිල, දූවේ මෝදර ආදී කෝවිල්වල මෙම පූජා පවත්වනු ලැබේ.)

මෙහි දී ප්‍රදේශයේ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ම එක් වී ගම්මුන්ගේ ආධාර උපකාර ඇතිව නිර්මාංශ ආහාර අඩංගු වූ දේව දානය පිළියෙල කරන අතර එය සමාජ අනුකලනයක් නිරූපණය කරන්නකි. දෙවියන්ගේ පරිභෝජනය උදෙසා පිළියෙල කෙරෙන දානය හෝ එක් රැස් කරන ද්‍රව්‍ය වංචා කිරීම හෝ අනිසි ලෙස පරිභෝජනය කිරීම හෝ දේව උදහසට ලක්වීමට හේතු වන බව විශ්වාස කරන බැවින් එවැනි කටයුතුවලින් මිදීමට ගැමියෝ වග බලා ගනිති. කෝවිල් වල මෙම ශාන්තිකර්මය පැවැත්වීමත්, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම දේව දානය පිළියෙල කිරීම සඳහා සහභාගී වීමත්, ප්‍රාසංගික ලක්ෂණවලට වඩා පූජාර්ථය කෙරෙහි ප්‍රමුඛස්ථානය ලබා දීමත්, කාලපන්දම් ගහ සඳහා පුවක් ගසක් කැපීමේ දී ගස කපා ගන්නා විට බිම නොවැටෙන සේ පුරුෂයන් විසින් අත් වලින් ඇල්ලීමත්, එම ප්‍රදේශයට පමණක් ආවේණික අප්‍රකට දේව වන්දනයක් අන්තර්ගතවීමත් කිරි පොහොය ශාන්තිකර්මය ට ආවේණික විශේෂතා ලෙස සඳහන් කළ හැකි ය. ඉහත සඳහන් ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් වැලිතර ප්‍රදේශයේ ජනයා අතර ප්‍රචලිත ජනශ්‍රැති වලට මුල බීජ සපයා ගත හැකි සංස්කෘතිකාංගයක් වශයෙන් කිරි පොහොය ශාන්තිකර්මය හඳුන්වා දිය හැකි ය.